## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ දකුණු හා නිරිත දිග දිශානුගතව පිහිටි ගාල්ල දිස්ත්‍රික්කය දකුණු පළාතට අයත් දිස්ත්‍රික්ක තුනෙන් එකකි. සමස්ත දකුණු පළාතට අයත් භූමි ප්‍රමාණයෙන් 30%ක් එනම්, වර්ග කිලෝමීටර 1,652ක විශාලත්වයෙන් යුත් ගාලු දිස්ත්‍රික්කයේ ගොඩබිම් ප්‍රමාණය වර්ග කිලෝමීටර 1,617කි. ගාල්ල දිස්ත්‍රික්කය, උතුරු අක්ෂාංශ 5°58'–6°26'හා නැගෙනහිර දේශාංශ 79°59'–80°29' අතර පිහිටා ඇත. එය උතුරු දිශාවෙන් කළුතරටත්, නැගෙනහිර දිශාවෙන් මාතර හා රත්නපුරයටත්, දකුණ සහ බස්නාහිර දිශාවන් ඉන්දියන් සාගරයටත් මායිම් වේ.

ගාල්ල දිස්ත්‍රික්කයේ භූවිෂමතාවය වෙරළබඩ පහත්බිම් හා තැනිබිම් මෙන්ම නැගෙනහිර දෙසට ව්‍යාප්ත වනසේ පිහිටා ඇති කුඩා කඳුවැටි වලින් සමන්විත වේ. දිස්ත්‍රික්කයේ බස්නාහිර සහ දකුණු මායිම් වන වෙරළ තීරයේ සිට රට අභ්‍යන්තරයට යන විට තැනිබිම් පසු කර කඳු වැටි සහිත ප්‍රදේශ හමුවේ. වෙරළබඩ පහත්බිම් හා තැනිතලා දළ වශයෙන් මුහුදු මට්ටමේ සිට මීටර් 30 දක්වා උසකින් යුක්ත වන අතර එම කලාපය තුළ වෙරළ තීරය, වැලි වැටි හා වැලි පර, ගංගා මෝය, කලපු සහ කඩොලාන ශාක ආශ්‍රිත වගුරු බිම් පිහිටා ඇත. කොග්ගල කලපුව, හික්කඩුව ගඟ, මාදු ගඟ මෙන්ම දෙද්දූව, මාදම්පේ සහ රත්ගම ප්‍රදේශවල පිහිටා ඇති අභ්‍යන්තර ජලාශ්‍රිත පෙදෙස් ජෛව විවිධත්වයෙන් යුත් කඩොලාන ශාක පද්ධතිවලින් සමන්විතය. හිනිදුම කන්ද, කබරගල කන්ද, කැකිරිහේන කන්ද, තිබ්බොටුවාව, වාඩියහේන, බලගල මෙන්ම දිස්ත්‍රික්කයේ තැනින් තැන සැළකිය යුතු උසකින් යුත් ශේෂ කඳු ද වේ. යුනෙස්කෝ සංවිධානය විසින් නම් කරන ලද ලෝක උරුමයක් වන සිංහරාජ නිවර්තන වැසි වනාන්තරයෙන් කොටසක් සහ කන්නෙළිය හා කොට්ටව රක්ෂිත වනාන්තර ද ගාල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති ජෛව විවිධත්වයෙන් ඉතා ඉහළ භූමි ප්‍රදේශ වේ.

ගාල්ල දිස්ත්‍රික්කයේ භූමියවැඩි වශයෙන් නිර්මාණය වී ඇත්තේ රෙඩ්යෙලෝ පොඩ්සොලික් පසෙනි. අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මීටියාගොඩ ප්‍රදේශයේ ඉතා දුර්ලභ පාෂාණයක් වන චන්ද්‍රකාන්ති පාෂාණය දක්නට ලැබේ.

මෙම දිස්ත්‍රික්කය හරහා ගලා යන ප්‍රධාන ගංගාව ගිං ගඟයි. එය ගොන්ගල කඳු වැටියෙන් ආරම්භ වී දිස්ත්‍රික්කය මධ්‍යයෙන් ගලා ගොස් කිලෝමීටර 113ක දුරක් ගෙවා ගිංතොටින් ඉන්දියන් සාගරයට එක්වේ. ගිං ගඟට එක් වන ඇළ දොළ විශාල සංඛ්‍යාවක් ඇති අතර එසේ එක් නොවන ඇළ දොළ මෙන්ම අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි හියාරේ අභ්‍යන්තර ජලාශය ද ජලවහන රටාවට එක්වී දිස්ත්‍රික්කයේ ජල අවශ්‍යතාවය සපුරයි. දිස්ත්‍රික්කයේ දක්නට ලැබෙන දර්ශනීය දිය ඇළි ලෙස දූලි ඇල්ල, ගල්ඔරුව ඇල්ල සහ අඬා හැලෙන ඇල්ල නම් කළ හැකිය.

ගාල්ල දිස්ත්‍රික්කය 23.5°C අවම උෂ්ණත්වයකින් හා 31.3°C උපරිම උෂ්ණත්වයකින් යුක්ත වේ. මිලිමීටර් 2000–2500 ක වාර්ෂික වර්ෂාපතනයක් සහිත මෙය තෙත් කලාපීය දේශගුණික භූමි ප්‍රදේශයට අයත් වේ. අන්තර් මෝසම් සුළං සහිත කාලපරිච්ඡේදයේ හා නිරිත දිග මෝසම් සුළං සහිත කාලපරිච්ඡේදයේ මෙන්ම සංවහන ක්‍රියාවලිය මඟින් ද දිස්ත්‍රික්කයට වැඩි වශයෙන් වර්ෂාව ලැබේ. ගාල්ල දිස්ත්‍රික්කය නිරන්තර ආපදා තත්ත්වයන්ට බහුල ලෙස ලක් නොවන නමුත් විවිධ කාලගුණික හා දේශගුණික විපර්යාසයන් හමුවේ කලින් කල ගංවතුර, නායයෑම්, සුළි සුළං හා මුහුදු කැම් ආදි ස්වභාවික ව්‍යසන තත්ත්ව ඇතිවේ. මේ අතර මෝසම් සුළං, වර්ෂාපතනය අධික මැයි  හා නොවැම්බර් මාසයන්හි දී පහත්බිම් රැසක් ගංවතුර අවදානමට ලක්වීමෙන් දිස්ත්‍රික්කයේ සාමාන්‍ය ජන ජීවිතයට හා ඔවුන්ගේ ආර්ථික කටයුතු වලට බාධා පමුණුවයි.

## Introduction

Galle District is one of the three districts belonged to the Southern Province and located amidst the South and South Western tip of Sri Lanka. The total extent of land in Galle District is 1652 square kilo meters whereas 1,617 square kilo meters has been consisted of the land mass. Galle District which is located in the Southern Province lies between 5.58°-6.26° of northern latitudes and between 79.59°-80.29° of eastern longitudes. This district is bounded on the north by Kalutara and East by Matara and Rathnapura districts, on the South & West by Indian Ocean.

When considered the topography of Galle District, it's terrain is mostly low, flat to rolling plain with mountains in the central interior. When passing the coastal belt which is bounded by the Western and Southern boundaries of the district, plains and Chain Mountains are visible respectively. Coastal low lines and valleys have been elevated up to 30 meters of height from the sea level whereas this zone contained with sea shore, dunes, coral reefs, river mouth together with lagoon and marshy lands affiliated with mangrove plants. The internal wet lands located within Koggala lagoon, Hikkaduwa River, Madu River, the areas such as: Dedduwa, Madampe and Rathgama have been included with the mangrove plant bio-diversities. Rock formations such as: Hiniduma mountain, Kabaragala Mountain, Kekirihena kanda, Thibbotuwawa mountain, Wadiyahena mountain and Balagala mountains are available and existed at different places within the district. Highly conserved areas with the bio-diversity has also been existed within Galle District as a part of the Sinharaja Tropical rain forest as a world heritage declared by the UNESCO and the reserved forests such as Kanneliya and Kottawa are also available within the district.

The land-mass of Galle District enrich with natural resources created with the quartzites named as red yellow podzolicwhich is noteworthy amongst the others. The moonstone mines are also existed in the Meetiyagoda area within the Divisional Secretariat Division, Ambalangoda.

Gin is the main river that flows through the district. It's water sources arrive from Gongala mountains and flow through the district and finally reached to the Indian Ocean from the river mouth of Gintota passing 113 km. There are number of lakes and streams which meet the ocean whereas rivers and streams which do not meet the sea as well as the Hiyare internal water resource together fulfill the water requirement of the district. Dooli Ella, Gal Oruva Ella & Andahelena Ella can be named as magnificent waterfalls visible in the district.

Galle District is consisted of with the range of temperature from $23.5^{0}$C - $31.3^{0}$C. This area is belonged to wet zone climatic land area as this experiences an annual rainfall in between 2000mm - 2500mm. The district gains excessive rain during inter monsoon period, south west monsoon period and by the convectional rainfall occurred due to the heat differentiations occurred in between the atmosphere levels. Even though, the Galle District does not affect by the frequent disaster situations. However, the natural disasters such as: flood, inundations, landslides, cyclones and sea erosions are occurred due to the various weather and climatic changes arisen very rarely. Meanwhile, several low lands are usually affected by the vulnerable inundation conditions during the monsoon rainfall in May - November by creating restrictions and barriers over the general public's lifestyle and their economic activities being carried out within the district.